**ශීර්ෂය 136 - ක්‍රීඩා අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

---

ශීර්ෂය 136 - ක්‍රීඩා අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ඔක්තෝබර් 11 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් හා සොයා ගැනිම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය හා ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය හා ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 1,635.73 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 1,216.38 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 419.35 ක් හෙවත් සියයට 25.64 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2016 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| පුනරාවර්තන | 475.79 | 436.57 | 39.22 | 8.24 |
| මූලධන | 1159.94 | 779.81 | 380.13 | 32.77 |
| එකතුව | 1,635.73 | 1,216.38 | 419.35 | 25.64 |

**2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාළ විෂය අංක 13601 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 6.00 | 5.99 | 4.50 | 8.12 | 26.00 | 16.56 |

**2.3 පොදු තැන්පත් ගිණුම**

අමාත්‍යාංශය යටතේ වන තැන්පතු ගිණුම් 03 ක 2016 දෙසැම්බර් 31 දිනට වූ ශේෂවල එකතුව රු.මිලියන 14.55 ක් විය. විස්තර පහත දැක්වේ.

| **තැන්පත් ගිණුම් අංකය** | **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0001/0106/000 | 0.39 |
| 6000/0000/00/0002/0147/000 | 0.08 |
| 6000/0000/00/0016/0093/000 | 14.08 |
| එකතුව | 14.55 |

**2.4 විගණන නිරීක්ෂණය**

ක්‍රීඩා අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය |
|---|---|
| (අ) ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ආ) පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |

## 3.2 විසර්ජන ගිණුම

### (අ) අයවැය විචලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මූලධන වැය විෂයයන් 5 ක් සඳහා සලසා තිබුණු රු. මිලියන 26.35 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ii) වැය විෂයයන් 50 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 සිට සියයට 98 දක්වා අතර පරාසයක පැවතිණි.

### (ආ) නොසැසඳීම්

ක්‍රීඩා නවාකරණ ව්‍යාපෘති වැය විෂයය යටතේ (136-2-4-1-2401) වැය ලෙජරය අනුව වියදම රු. 19,198,113 ක් වූ අතර භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව එය රු. 19,392,463 ක් වූයෙන් රු. 194,350 ක වෙනසක් නිරීක්ෂණය විය.

## 3.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 13601 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.251,746 ක් විය. එම හිඟහිටි ණය ශේෂවලින් රු.117,015 ක් සේවය අතහැර ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු හිඟ ණය විය. එම ණය ශේෂ වර්ෂ 03 සිට වර්ෂ 04 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණු අතර ඒවා අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අමාත්‍යාංශයේ පොත් අනුව රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුමේ ශේෂය සහ භාණ්ඩාගාර පොත්වල දැක්වෙන ශේෂය අතර රු.175,498 ක වෙනසක් නිරීක්ෂණය විය.

## 3.4 වත්කම් කළමනාකරණය

### 3.4.1 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

2016 වර්ෂයට අදාළ සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 770 පරිදි කටයුතු කර නොතිබුණි.

### 3.4.2 වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම

අමාත්‍යාංශ 3 කට හා වෙනත් රජයේ කාර්යාලයකට අයත් වාහන 09 ක් විධිමත්ව පවරා නොගෙන අමාත්‍යාංශයේ කටයුතු සඳහා භාවිතා කර තිබුණි.

## 3.5 කාර්යසාධනය

පහත සඳහන් විදේශීය තරඟාවලි සඳහා සමාලෝචිත වර්ෂයේදී ක්‍රීඩකයින් සංඛ්‍යාවට වඩා නිලධාරීන් සහභාගි වූ අවස්ථා නිරීක්ෂණය විය.

| ක්‍රීඩා සම්මේලනය | රට | තරඟාවලිය | සහභාගි වූ නිලධාරීන් | සහභාගී වූ ක්‍රීඩකයින් |
|---|---|---|---|---|
| ඔලිම්පික් | බ්‍රසීලය | පැරා ඔලිම්පික් තරඟාවලිය | 15 | 09 |
| පාපන්දු | ඉන්දියාව | දකුණු ආසියානු කුසලානය | 19 | 10 |

මෙහිදී බ්‍රසීලයේ පැරා ඔලිම්පික් තරඟාවලියේදී හෙල්ල විසි කිරීමේ තරඟයෙන් එක් ලෝකඩ පදක්කමක් පමණක් හිමිකර ගෙන තිබූ අතර ඉන්දියාවේ පැවැත්වූ පාපන්දු තරඟාවලියෙන් කිසිදු ජයක් අත් කර ගෙන නොතිබුණි. ජාත්‍යන්තර තරඟ සඳහා නිලධාරීන් සහභාගී කරවීම නිශ්චිත ප්‍රතිපත්තියක් මත සිදුකර නොතිබුණ බව නිරීක්ෂණය විය.

## 3.6 අවිධිමත් ගනුදෙනු

12 වන දකුණු ආසියානු ක්‍රීඩා උළෙලට සහභාගි වූ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ලබා දීමේ අරමුණින් ක්‍රීඩා වෛද්‍ය ආයතනය විසින් ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවෙන් රු. 1,330,073 ක මුදලක් වැයකර මිලදී ගෙන ඇති ඖෂධ තොගය සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) ක්‍රීඩා උළෙල පැවැත්වෙන අවස්ථාවේ ප්‍රයෝජනයට ගැනීම සඳහා ක්‍රීඩා සංගම්වලට බෙදා හැර ඇති ඖෂධවලින් නිකුත් නොකොට ඉතිරි වූ ඖෂධ සමහර ක්‍රීඩා සංගම් වෙතින් 2017 ඔක්තෝබර් 11 දින දක්වාම වෛද්‍ය ආයතනයට ආපසු ලබා දී නොතිබුණි.

(ii) ක්‍රීඩා උළෙලේ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ලබා දී ඇති ඖෂධ සම්බන්ධ විස්තර සහ ඉතිරි වූ ඖෂධ සම්බන්ධව තොරතුරු දැක්වෙන ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

**3.7 මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

--------------------------------------------------------

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 33 | 23 | 10 |
| (ii) | තෘතියික මට්ටම | 16 | 11 | 05 |
| (iii) | ද්විතියික මට්ටම | 109 | 75 | 34 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 84 | 74 | 10 |
| | එකතුව | 242 | 183 | 59 |

ද්විතියික මට්ටමේ පර්යේෂණ නිලධාරී අනුමත කාර්ය මණ්ඩලය දෙදෙනෙක් වන අතර තථ්‍ය කාර්ය මණ්ඩලය තුන්දෙනෙක් වීම හේතුවෙන් අනුමත නොවූ එක් නිලධාරියෙකු තථ්‍ය කාර්ය මණ්ඩලය තුළ විය. ඒ සඳහා විධිමත් අනුමැතියක් ලබා ගැනීමට අමාත්‍යාංශය විසින් කටයුතු කර නොතිබුණි.